ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය
இலங்கையின் பிரதம அமைச்சர்
**Prime Minister of Sri Lanka**

# <u>නිදහස් දින පණිවුඩය</u>

යටත්විජිත පාලනයෙන් නිදහස ලබා 70 වසරක් සපිරීම අද අපි මහත් අභිමානයෙන් යුතුව උත්කර්ෂවත්ව සමරන්නෙමු. 1948 වසරේ ඒ නිදහස දිනාගැන්මට අපට හැකි වන්නේ සියලු භේද අමතක කොට එකම ශ්‍රී ලාංකේය ජනතාවක් ලෙස ජාතික සමගියෙන් කටයුතු කිරීම නිසා බව අප කිසිසේත් අමතක කළ යුතු නැත.

දිනූ නිදහස අර්ථවත් කරගැනීමට නම් වාර්ගික, ආගමික, පක්ෂ පාට සියලු භේදයන් ඉක්මවා “එකම දැයක්”තුළ අභිමානවත්ව, සාමකාමීව, එක්සත්ව කටයුතු කිරීම අප සැමගේ වගකීමකි.

නිදහස වඩාත් පරිපූර්ණ වන්නේ සමාජ, දේශපාලන, ආර්ථික නිදහස මෙන්ම මානව ගරුත්වය, අධ්‍යාත්මික නිදහසද උදා වීමෙනි. අප රජය පත්වීමත් සමග ඒ සඳහා අවැසි සමාජ, දේශපාලන, ආර්ථික පසුබිම ගොඩනැගීමට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කටයුතු කළ අතර, වඩාත් ස්ථාවර නිදහස් සමාජයක් ගොඩනැංවීමට තවදුරටත් කටයුතු කරමින් සිටියි.

“එකම දැයක්” තේමාව තුළ 70 වෙනි නිදහස් සමරුව මහත් උත්කර්ෂයෙන් සමරන මේ මොහොතේ දිනූ නිදහස වඩාත් තිරසර, අර්ථසම්පන්න නිදහසක් බවට පත් කරගැනීම සඳහා සමස්ත ශ්‍රී ලාංකේය ජනතාව එක්ව කටයුතු කරනු දැකීම මාගේ අපේක්ෂාවයි.

දේශයේ දියුණුව උදෙසා සැබෑ පුරවැසියන් සේ කැපවීමට මෙම නිදහස් දිනයේ දී විශේෂයෙන් අදිටන් කරගනිමු.

**රනිල් වික්‍රමසිංහ**
**අග්‍රාමාත්‍ය**

2018 ජනවාරි 15